**<u>ව්‍යාපාර නාමයක් ලියාපදිංචි කිරීම සඳහා වන ලියවිලි හා ඒ සඳහා උපදෙස්.</u>**

01. **අදාල ඉල්ලුම් පත්‍රය** – (තනි/හවුල්) පැහැදිලි අත් අකුරින් සම්පූර්ණ කර අයිතිකරු විසින්ම භාර දෙන්න.

02. **පළාත් පාලන ආයතනයට** (ප්‍රාදේශීය සභාවට) ව්‍යාපාර ගාස්තු ගෙවා එයින් ලබා දෙන රිසිට්පතෙහි හා වෙළඳ බලපත්‍රයේ ඡායා පිටපතක්.

03. **ග්‍රාම නිලධාරි මගින් සහතික කරගත යුතු ලියවිලි,**

- ව්‍යාපාර හිමිකරුගේ හැඳුනුම්පතෙහි ඡායා පිටපතක් (පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් සහතික කල යුතුයි)
- ව්‍යාපාරය පවත්වාගෙන යන ස්ථානයේ ඉඩමේ ඔප්පුවේ ඡායා පිටපතක්
- එකී ස්ථානය ව්‍යාපාරිකයාට අයත් නොවේ නම්, අයිතිකරුගෙන් එම ස්ථානයේ ව්‍යාපාරය ලියාපදිංචි කිරීමට කැමැත්ත පල කරන ලද ලිපිය.

04. **සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වාර්තාව** (ආහාර පාන අලෙවි සැල් , බියුටි සැලෝන්, තෙල් මෝල් ආදී.... ව්‍යාපාර සඳහා)

05. **පරිසර ආරක්ෂණ බලපත්‍රය හා නිරවුල් සහතික** (පොල් තෙල් මෝලක්, ලී මෝලක්, කොහු මෝලක්, වී මෝලක් .සත්ව ගොවිපළ, වැනි ව්‍යාපාර සඳහා...)

06. **හැකියාව පිළිබඳ සහතික** ( ඇඳුම් මැසීම, බියුටි සැලෝන්, සැලසුම් නිර්මාණ, ඡායාරූප ශාලා, විදුලිය සම්බන්ධ නිමවුම්, කොන්ත්‍රාත් කටයුතු ව්‍යාපාර සඳහා)

**<u>උපදෙස්</u>** අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී,

- අංක 03ට අදාලව ව්‍යාපාර ස්ථානයේ ලිපිනය යොදන්න.
- අදාල නොවන කරුණු වලට නැත යනුවෙන් යොදන්න.
  ව්‍යාපාරය ආරම්භ කර දින 14 ඇතුලත ලියාපදිංචි කරන්නේ නම් ලියාපදිංචි ගාස්තුව රු. 4000.00/5000.00කි.
- දින 14 ඉක්මවා ඇත්නම් මසකට රු. 150.00 බැගින් දඩ මුදලක් අය කරනු ඇත.
- ව්‍යාපාර සංශෝධන ගාස්තුව රු. 2500/-කි.
- ව්‍යා. නාම සහතිකයේ පිටපතක් ලබා ගැනීමේ දී එක් පිටපතක් සඳහා ගාස්තුව රු.750.00කි.

**ව්‍යාපාර නාම සහතික නිකුත් කරනු ලබන්නේ ඉහත ලියවිලි ඉදිරිපත් කිරීමෙන් හා අදාල වාර්තා ලබා ගැනීමෙන් පසුව බව කරුණාවෙන් සලකන්න.**

..........................................................................................................................................